ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලයට අනුබද්ධිත ශ්‍රී ලංකා සංස්කෘතික අධ්‍යාපන කේන්ද්‍රය, ඩුබායි.
Sri Lanka Cultural Education Centre attached to the Consulate General of Sri Lanka, Dubai
බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි අංක E/A.D./ද.ප./ලි/001

2018 පෙබරවාරි 02 යොමු අංකය: 1718 -020

දයාබර දෙමව්පියන් වෙත,

“ශ්‍රී ලංකා දිනය 2018” - දහම් පාසලේ දරුවන්ගේ සහභාගීත්වය

ඩුබායිහි “ශ්‍රී ලංකා දිනය 2018” උත්සවය පැවැත්වෙන 2018 පෙබරවාරි මස 9 වැනිදා, සිකුරාදා දින දහම් පාසල පන්ති නොපැවැත්වෙන අතර කලින් දන්වා එවූ පරිදි, මෙම උත්සවයේ විශේෂ අංගයන් සඳහා සහභාගී වන දරුවන් සමග දහම් පාසලේ සියලුම දරුවන් මෙදින පැවැත්වෙන “ශ්‍රී ලංකා - එක්සත් එමීර් රාජ්‍යය මිත්‍රත්ව පා ගමණ” _ “Sri Lanka – UAE Friendship Walk” සඳහා සහභාගී වන ලෙස ඉතා කරුණාවෙන් ඉල්ලා සිටිමු. මෙම උත්සවය පිලිබඳ විස්තර සඳහා දහම් පාසලේ වෙබ් අඩවියට http://www.dhahampasala.org පිවිසෙන්න.

පහත සඳහා කරුණු පිළිබඳව ඔබගේ අවධානය යොමු කරන මෙන් කරුණාවෙන් ඉල්ලා සිටිමු.

- වේදිකාවේ ජාතික ගීතය ගායනා කිරීම සඳහා දහම් පාසල් ඇඳුමින් සැරසී සිටින දරුවන් පමණක් සවස 3.45 ට ප්‍රධාන වේදිකාව අසලට පැමිණෙන්න.
- මෙම උත්සවයේ විශේෂ අංගයන් සහ පා ගමනට සහභාගී වන දරුවන් හට විශේෂ සහතික පත්‍ර නිකුත් කරන බව කරුණාවෙන් දැනුම් දෙමු.
- මෙදින උත්සවයට සහභාගී වන දරුවන්ගේ පැමිණීම දහම් පාසලේ නාම ලේඛනයේ සටහන් සටහන් කරන අතර ඒ සඳහා කරුණාකර පන්ති භාර ගුරුතුමා/ ගුරුතුමිය හමුවී පැමිණීම සටහන් කරගන්න.
- පා ගමනට සහභාගී වන දරුවන් ඇවිදීමට සුදුසු පාවහන් පැළඳ සහභාගී කරවන්න.
- මෙම උත්සවයේ විශේෂ අංගයන් සඳහා සහභාගී වන දරුවන් එම අංගයන් සඳහා අවශ්‍ය ඇඳුමද, පා ගමනට සහභාගී වන දරුවන් දහම් පාසල් ඇඳුමින් ද සැරසී උත්සව භූමියට පැමිණෙන ලෙස ඉතා කරුණාවෙන් ඉල්ලා සිටිමු. දරුවන් ගේ හැඳුනුම් පත (ID Card) පැළඳීම අවශ්‍ය නැති බව සලකන්න.
- පා ගමනට සහභාගී වන දහම් පාසල් දරුවන්ගේ දෙමාපියන්ද, ශ්‍රී ලාංකික ජාතික උත්සවයකට සුදුසු, සුදු හෝ ලා පාට ඇඳුමකින්/ ජාතික ඇඳුමෙන් හෝ සාරිය / ඔසරියකින් සැරසී සහභාගී වන ලෙසද කරුණාවෙන් ඉල්ලා සිටිමු.

**උත්සවය සහ උත්සවයට සහභාගී වීම පිලිබඳ වැඩි විස්තර ලබන සතිය තුළදී දැනුම් දෙමු.**

පෙබරවාරි 16 වැනිදා, සිකුරාදා සිට දහම් පාසල සුපුරුදු පරිදි පැවැත්වෙන බව සලකන්න.

ස්තුතියි,

සංවිධායක මණ්ඩලය

Sri Lanka Consulate General Office, No. 2, Street 322-B, Al Hudaiba, Dubai, UAE. Postal: PO Box 51528, Dubai, UAE.
TP. +971 4 3986535, Fax: +971 4 3984687, E Mail: dahampasaladubai@gmail.com, Web: http://www.dhahampasala.org